# 2024 මාර්තු 17 වැනි දින පැවති ආදි ශිෂ්‍ය සංගමයේ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව

**ස්ථානය - ධර්මපාල විද්‍යාලයේ ප්‍රධාන ශාලාව** **වේලාව - පෙ.ව 9.15**

**සහභාගීත්වය**

1. විධායක සභාපති - දීපාල් හේරත් මයා
2. ප්‍රධාන ලේකම් - ආසිරි ද සොයිසා මයා
3. භාණ්ඩාගාරික - වසන්ත මල්වත්තගේ මයා
4. නියෝජ්‍ය ලේකම් - කේ. වී. පී. නිරෝෂණ මයා
5. නියෝජ්‍ය සභාපති - අනුර අබේරත්න මහතා
6. උප සභාපති - ගිහාන් ආරියරත්න මයා
7. උප සභාපති - චමිඳු විජයවර්ධන මයා
8. හිටපු විː සභාපති - ජීවන් ප්‍රියදර්ශන මයා
9. උප සභාපති - රුසිරු වගීෂ බැලගම මයා
10. සංස්කාරක - ධනංජ ඇල්විටිගල මයා
11. උප ලේකම් - නයෝමාල් ඉඹුලාන මයා
12. උප භාණ්ඩාගාරික - එම්. එස්. උපාලි මයා
13. උප සංස්කාරක - චතුර නිලාන් බණ්ඩාර මයා
14. කාරක සභික - ජනකාන්ත ලක්ෂ්මන් මයා
15. කාරක සභික - සුලක්ෂණ විදුරංග මයා
16. කාරක සභික - එච්.එච්. සී. ධර්මසේන මයා
17. කාරක සභික - අරුණි රශ්මිකා ජයසිංහ මිය
18. කාරක සභික - චරිත් ලියනගේ මයා
19. කාරක සභික - කේ. බී. ඩී. පෙරේරා මයා
20. කාරක සභික- යශෝදාරා ජේ. සෝමදාස මිය
21. ද/ සංසඳ - ඉන්දික සිරිවර්ධන මයා
22. අරුණලු - නලින් සම්පත් ද සිල්වා මයා
23. අරුණලු - සුජානි පූර්ණිමා මිය
24. පෙරමග - නිශාදි රුක්ශානි මිය
25. පෙරමග - සාරංග පීරිස් මයා
26. සියසර - අරවින්ද නවරත්න මයා
27. සියසර - විජිනි තාරිකා මෙය
28. ජී. ආර්. එම්. ටී. බණ්ඩාර මහතා
29. චාන්දනී වේරගල මහත්මිය
30. වෛද්‍ය හේමන්ත පෙරේරා
31. වෛද්‍ය ලංකා තෙන්නකෝන් මිය
32. ලෙනාඩ් රාජපක්ෂ මහතා
33. හරේන්ද්‍ර වැලිවිට මහතා
34. උමාෂා වික්‍රමනායක මහත්මිය
35. විමංසා පෙරේරා මහත්මිය
36. දයානි එදිරිසිංහ මිය
37. ශාලක මුතුතන්ත්‍රී මයා

ඇතුලු ආදි ශිෂ්‍ය සංගමයේ යාවජීව සාමාජිකයින් 123 ක් සහභාගි විය. (පැමිණීමේ ලේඛනය අමුණා ඇත)

පෙ.ව 9.15 ට පමණ ගණ පූරණය සහිතව විශේෂ මහා සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

න්‍යායපත්‍රානුකූලව පන්සිල් ගැනීම, පාසල් ගීතය ගායනා කිරීම, ආදි කටයුතු නිම කිරීමෙන් පසු ගරු විධායක සභාපතිතුමා විසින් සභාව පිළිගන්නා ලදී. මෙදින රැස්වීමට ගරු විදුහල්පතිනිය පෞද්ගලික කටයුත්තක් නිසා සහභාගි විය නොහැකි බව ප්‍රධාන ලේකම්තුමාට දන්වා තිබූ බව ප්‍රධාන ලේකම්තුමා විසින් සභාවට දන්වන ලදී.

රැස්වීම කැඳවීමේ අරමුණ පැහැදිලි කළ ගරු විධායක සභාපතිතුමා 2023 වර්ෂයේ පැවති 75 වන වාර්ෂික මහා සභා රැස්වීමේ දී පත්වූ විධායක සභාවට පවරා දුන් වගකීමක් ලෙස එවකට පැවති ව්‍යවස්ථාවේ සියලු අඩුපාඩු හඳුනාගෙන නව ව්‍යවස්ථාවක් කෙටුම්පතක් කිරීම ආරම්භ කළ බවත් මෙම සංකීර්ණ ක්‍රියාදාමයට අනුශාසක මණ්ඩලය, ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපතිවරු, ලේකම්වරු, ආදි බොහෝ දෙනෙකුගේත්, දශක කණ්ඩායම් වල නිලධාරීන් බොහෝ දෙනෙකුගේත් අදහස් ලබාගත් බවත් පැවසීය. වසර 03 ක කාලයක සිට කමිටු රැස්වීම් ගණනාවක් පවත්වා එක් එක් රැස්වීම් වලදී එකතු කරන ලද නව අදහස් හා යෝජනා සියල්ල සංශෝධිත ව්‍යවස්ථාවේ නව කෙටුම්පත් ලෙස සියලු සභිකයින් වෙත ලිඛිතව දැනුවත් කරමින් අවසාන වශයෙන් සකස් කළ කෙටුම්පත විධායක සභාවේ අනුමැතිය සහිතව අද දින සාමාජිකයින්ගේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන බැව් පවසන ලදී.

එමෙන්ම විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා යෝජිත ව්‍යස්ථාව අනුමත කර ගත් පසු මෙම වසර සඳහා වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීම පිණිස ද විධායක සභිකයින්ගේ අනුමැතිය ද ලබාගත් බැව් විධායක සභාපතිතුමා ඔහුගේ කථාවේදී සඳහන් කරන ලදී.

තත්කාලීන ව්‍යවස්ථාවේ සහ යෝජිත ව්‍යවස්ථාව අතර මූලික වෙනස්කම් විධායක සභාපතිතුමා විසින් සැකෙවින් පහදා දෙන ලදී.

i. සාමාජිකත්ව වර්ග සඳහා ආධුනික සාමාජිකත්වය වෙනුවට විදුහල්පතිතුමියගේ යෝජනාව පරිදි "නවක සාමාජිකත්වය" යනුවෙන් ඇතුළත් කිරීම.

ii. දශක කණ්ඩායම් හා අනුබද්ධ සංවිධාන පිහිටුවීම, පවත්වාගෙන යාම සහ එම කණ්ඩායම් නියාමනය කිරීම සම්බන්ධව නව වගන්තීන් ඇතුළත් කිරීම.

iii. අනුශාසක මණ්ඩලයේ කාර්ය භාරය වඩාත් පැහැදිලිව සහ නිරවුල්ව සඳහන් කිරීම.

iv. විධායක සභාවේ තනතුරු වලට පත්වීමට සම්පූර්ණ කළ යුතු සාමාජිකත්ව කාල සීමා ලිහිල් කිරීම.

v. විධායක සභාවේ සියලු නිලයන්හි කාර්ය භාරය හා වගකීම් සවිස්තරාත්මකව සඳහන් කිරීම.

vi. විධායක සභාවේ පරිපාලන කාලය වසර 02ක් සඳහා දීර්ඝ කිරීම.

vii. නාම යෝජනා හා නිලවරණ කමිටුවක් හඳුන්වා දීම.

viii. මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය විධිමත්ව දැක්වීම.

ix. විනය ක්‍රියාමාර්ග ගැනීමේ පටිපාටිය නිරවුල්ව සකස් කිරීම.

x. රැස්වීම් කැඳවීමේ නිවේදන, රැස්වීම් පවත්වාගෙන යාම, නිලවරණ පැවැත්වීම ආදි කටයුතු සඳහා වැයවන විශාල පිරිවැය අවම කර ගැනීමේ සහ කළමණාකරණය කර ගැනීමේ අරමුණ ඇතිව නව තාක්ෂණික මෙවලම් හා ක්‍රමවේදයන් භාවිතා කිරීමේ ව්‍යවස්ථානුකූල අයිතිය ලබාදීම.

ඉහත සඳහන් කරුණු අතරින් ආදි ශිෂ්‍ය සංගමයේ මනා පරිපාලනය, කාර්යක්ෂමතාවය, වියදම් අඩුකර ගැනීම, සාමාජික සහභාගීත්වය, මූල්‍ය විනය හා දශක කණ්ඩායම් පරිපාලනය ආදි කරුණු සම්බන්ධයෙන් ඇති වන සුභවාදි බලපෑම් ඇති කරන කරුණු වෙන් වෙන වශයෙන් පැහැදිලි කරන ලදී.

විධායක සභාපතිතුමාගේ විස්තර දැක්වීමෙන් අනතුරුව මෙම යෝජිත ව්‍යවස්ථාව ආදි ශිෂ්‍ය සංගමයේ නව ව්‍යවස්ථාව ලෙස සභා සම්මත කරගත යුතු බැව් ඔහු විසින් සභාවට යෝජනා කරන ලදි. එම යෝජනාව චාන්දනී වේරගල මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

ඉන්පසු යෝජිත ව්‍යවස්ථාව සඳහා ඡන්දය විමසීමේ අවස්ථාව උදා වූ විට ගාමිණි විජයසේකර මහතා විසින් පහත සඳහන් විරෝධතාවය ඉදිරිපත් කරන ලදි.

## විරෝධතාවය

තත්කාලීන ව්‍යවස්ථාවේ 17.8.2 හා 17.8.3 වගන්තිය උපුටා දක්වමින්

විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැක්කේ එක් කරුණකට පමණක් බවත් යෝජිත ව්‍යවස්ථාව සම්මත කර ගත හොත් දෙවැනි කරුණ වශයෙන් රැස්වීම කැඳවීමේ නිවේදනයෙහි සඳහන් කර ඇති මහා සභා රැස්වීම කැඳවීමේ දිනය ප්‍රකාශ කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති බවත් ප්‍රකාශ කළේය.

මෙහිදී ආදි ශිෂ්‍ය සාමාජික, වෛද්‍ය ලංකා තෙන්නකෝන් මහත්මිය අදහස් දක්වමින් රැස්වීම කැඳවීමේ අරමුණ ඉෂ්ඨ කර ගැනීම විනා අනවශ්‍ය නිතී තර්ක ඉදිරිපත් කරමින් කාලය නාස්ති නොකරන ලෙස ඉල්ලා සිටියාය.

මෙහිදී ආදි ශිෂ්‍ය සාමාජික, විශේෂඥ වෛද්‍ය හේමන්ත පෙරේරා මහතා කතාකරමින් ගාමිණි විජයසේකර මහතා 17.8.2 වගන්තිය නිර්වචනය කළ ආකාරය වැරදි බව ප්‍රකාශ කළේය.

17.8.2 වගන්තියේ සඳහන් ආකාරයට විධායක සභාව විසින් විශේෂ මහා සභා රැස්වීමේ අවශ්‍යතාවය හදුනාගෙන ඇති බවත් එම අවශ්‍යතාවය ලෙස රැස්වීම කැඳවීමේ නිවේදනයේ කරුණු දෙකක් ලෙස සඳහන් කර ඇති බවත් එම කරුණු දෙකම අවශ්‍යතාවයේ කොටසක් බවත්, අද මෙතැනට පැමිණ ඇති සියලුම සාමාජිකයින් එම කරුණු පිළිබඳව දැනුවත්ව පැමිණ ඇති බවත් ප්‍රකාශ කළේය. එම නිසා මෙම රැස්වීම පවත්වාගෙන යාමට ඒක වචන බහු වචන ගැටලුවක් (කරුණ/ කරුණු) නැති බවත් ප්‍රකාශ කළේය.

ඉන් පසුව මෙහිදී ආදි ශිෂ්‍ය වෛද්‍ය හේමන්ත පෙරේරා මහතා සහ ජ්‍යෙෂ්ඨ ආදි ශිෂ්‍ය විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ බැංකුකරුවකු වන පී ආර් එම් ටී බණ්ඩාර මහතා විසින් පහත සඳහන් වගන්ති සඳහා එනම්

9.4.2 වගන්තිය

10.4 වගන්තිය

15.3.6 වගන්තිය

20.1.5 වගන්තිය

20.2.3 වගන්තිය

20.2.4 වගන්තිය

20.3.3 වගන්තිය

20.3.4 වගන්තිය

යෝජනා කරන ලද සංශෝ ධන වලට යටත්ව ඡන්දය විමසන අවස්ථාවේ සභා ගැබේ රැදී සිටි සාමාජිකයින් 123 දෙනා පහත සඳහන් ආකාරයෙන් අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන ලදී.

| | |
|---|---|
| යෝජිත ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට පක්ෂව | -120 |
| යෝජිත ව්‍යවස්ථාව සම්මත කර ගැනීමට විරුද්ධව | -2 |
| ඡන්දය පාවිච්චි කිරීමෙන් වැලකීම | -1 |

මෙහිදී විරුද්ධතාවය දැක්වූ සාමාජිකයින් වුයේ ගාමිණි විජයසේකර, කේ. වී. ජී. නිරෝෂණ මහතුන් වන අතර ඡන්දය ප්‍රකාශ කිරිමෙන් වැලකී සිටියේ හරේන්ද්‍ර වැලිවිට මහතාය.

ඒ අනුව මෙදින පැවති විශේෂ මහා සභා රැස්වීමේදී සභාගත කල ව්‍යවස්ථා කෙටුම්පත යෝජිත සංශෝධනයන්ට යටත්ව විශේෂ මහා සභා රැස්වීම අවසානයේ සිට ක්‍රියාත්මක වන, ධර්මපාල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාව ලෙස වැඩි ඡන්ද 117 කින් සභා සම්මත විය.

## වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම

මෙම වසරේ වාර්ෂික මහා සභා රැස්වීම 2024 මැයි මස 05 වැනි ඉරිදා දින පෙ.ව 9.30 ට පැවැත්වීමට සභාවේ අනුමැතිය හිමිවිය.

එම වාර්ෂික මහා සභා රැස්වීම අද දින සම්මත කර ගන්නා ලද නව ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට අනුකූලව කැඳවන බවත් එහිදී තේරී පත්වන නව විධායක සභාව ව්‍යවස්ථානුකූලව 2026 මාර්තු 31 දින දක්වා ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාව ලෙස කටයුතු කරනු ඇති බවත්, විධායක සභාපතිතුමා සඳහන් කළේය.


එබැවින් මෙම වසරේ වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමට අදාළ දිනයට සිදුකිරීමට නොහැකිවීම විධායක සභාව විසින් හිතාමතා මගහැරීමක් නොවන බවද සියලු කාරණා නිවැරදි කරමින් අද දින බහුතර ඡන්දයෙන් අනුමත වූ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමටත් ඒ සඳහා බහුතර සාමාජිකයින්ගේ අදහස් හා යෝජනා ලබාගැනීමටත් අවශ්‍ය වූ බැවින් මාර්තු 31 දිනට ප්‍රථම මහාසභා රැස්වීම කැඳවීමේ කටයුතු සම්පාදනය කළ නොහැකි වූ බවත්, නව ව්‍යවස්ථාවක් යටතේ නව යෝජනා කැඳවා ආදි ශිෂ්‍ය සංගමය පැහැදිලි වැඩපිලිවෙලක් සහිත නව දිශානතියකට යොමුකිරීමේ අරමුණින් යුතුව සද්භාවයෙන් ව්‍යවස්ථා සම්පාදනය සිදුකළ බවත් සභාවට දැනුම් දෙන ලදි. පසුගිය පරිපාලන වර්ෂ 3 ඉහත කර්තව්‍ය සඳහා කමිටු සභාපති ලෙස කටයුතු කිරීමේ දී මේ සඳහා නිරන්තර අදහස් හා යෝජනා එක්කරමින් දායක වූ සාමාජිකයින්ටත්, කමිටුව නියෝජනය කළ දශක හා අනු කණ්ඩායම් වල නියෝජිත සාමාජිකයින්ටත්, විධායක කමිටු සාමාජිකයින්ටත්, අනුශාසක මණ්ඩලයේ සැමටත්, විනය කමිටුව හා විගණන කමිටුවේ සාමාජිකයින්ටත්, එසේම සංගමයේ සභාපති/විදුහල්පති මහේෂිකා රූපසිංහ මහත්මියටත් ගෞරව ස්තුතිය පුද කරන ලදි.

එසේම මෙම කාර්යය සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් කාර්යාලයේ සේවක මණ්ඩලයටත්, යෝජිත කෙටුම්පත වෘත්තිය මට්ටමින් සංස්කරණය කරමින් පොතක් ලෙස ඔබ හමුවට ඉදිරිපත් කිරීමට තම වෘත්තිය දායකත්වය ලබාදුන් සංගමයේ සංස්කාරකතුමාටත් ස්තුතිය පළ කරන ලදි.

එසේම අවසාන වශයෙන් සංගමයේ දිශානතිය යම් වෙනසක් සිදුකිරීමට ගත් මෙම ඉදිරි පියවර පිලිබඳව තම මතය ප්‍රකාශ කිරීමට තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය කැප කරමින් අද රැස්වීමට සහභාගි වූ සියලු සාමාජිකයින්ට ද ස්තුතිය පුද කිරීමෙන් පසු සභාවේ කටයුතු අවසන් කරන ලදි. එසේම පත්වන විධායක සභාවට මාස 23ක පාලන කාලයක් ලැබෙන බව ද වැඩිදුරටත් සඳහන් කළේය.

මෙයට,

විධායක සභාව වෙනුවෙන්



ආසිරි ද සොයිසා<br>
ගරු ප්‍රධාන ලේකම්

## සටහන්

### පසුව අණාවරණය වූ කරුණු - සාමාජිකයින් දැණගැනීම පිණිස

පහත උපුටා දක්වා ඇති පැරණි ව්‍යවස්ථාවේ 34.2 වගන්තිය ප්‍රකාරව ගාමිණි විජයසේකර මහතා විසින් විශේෂ මහා සභා රැස්වීමක දී සාකච්ඡා කළ හැක්කේ ***එක් කරුණක් පමනක් ලෙස*** ඉදිරිපත් කළ තර්කය වලංගු තර්කයක් නොව බැව් පසුව අනාවරණය විය.

**එවකට පැවති ව්‍යවස්ථාවේ 34.2 වගන්තිය උපුටා දැක්වීම**

"34.2. අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම ව්‍යවස්ථාවේ ඒකවචනාර්ථ සෑම යෙදුමකටම බහු වචන යෙදුමක්ද, පුරුෂ ලිංග යෙදුමකට ස්ත්‍රී ලිංග යෙදුමක් ද, ඇතුළත් වේ. "

උපුටා දැක්වීම අවසන්